නිපුණතා මට්ටම 7.2

# පොළොන්නරු යුගයේ චිත්‍ර,මූර්ති කැටයම් හා ගෘහ නිර්මාණ







## 11 ශ්‍රේණිය


සැකසුම

ටී.ඒ.යූ ගුණසේකර.
තුල්හිරිය ධර්මසිරි සේනානායක ම.ම.වි.
කෑගල්ල කලාපය.

# පොළොන්නරු යුගය (ක්‍රි.ව 1055-1232)පිළිබඳව කෙටි හැඳින්වීමක්

මෙම යුගය, පොළොන්නරුව නගරය කේන්ද්‍රකර ගනිමින් නිර්මාණය වීම වීම නිසා පොළොන්නරුව රාජධානිය ලෙස හැඳින්වේ.

මෙම රාජධානිය පාලනය කළ ශ්‍රේෂ්ඨ පාලකයන් ලෙස පළමුවන විජයබාහු රජු(ක්‍රි.ව 1055-1110), මහා පරාක්‍රමබාහු රජු ( ක්‍රි.ව 1153-1186) සහ නිශ්ශංකමල්ල රජු (ක්‍රි.ව 1187-1196) වැනි පාලකයන් නම් කළ හැකිය.

## පොළොන්නරුව නගරය





මෙම පාලකයන් යටතේ රට සමෘද්ධිමත් වූවා පමණක් නොව තාක්ෂණය සහ කලාව වැනි අංශයන්හි ද සුවිශේෂී දියුණුවක් ඇති කරන ලදී.

# පොළොන්නරුව පූජා නගරය තුළ ඇති පූජනීය ස්ථාන කිහිපයක්

- පොළොන්නරුව රාජධානියට වරින්වර දකුණු ඉන්දියානු ආක්‍රමණ කිහිපයක් එල්ල විය.
- පොළොන්නරුව නගරය, සිය පාලන මධ්‍යස්ථානය ලෙස පළමුව තෝරා ගත්තේ දකුණු ඉන්දියානු චෝලයන් ය.
- දකුණු ඉන්දියානු කාලිංග වංශික පාලක කාලිංග මාඝ ක්‍රි.ව 1215 දී පොළොන්නරුව ආක්‍රමණය කර පොළොන්නරුව රාජධානිය සම්පූර්ණයෙන්ම බිඳ දමන ලදී.
- කාලිංග මාඝගේ වසර 40 ක පාලන කාලය තුළ පෙර රජුන් ඉදිකළ පොළොන්නරුවේ, පූජනීය ස්ථාන හා පොදු ස්ථාන රැසක් විනාශකර දැමූ බව මහාවංසයේ සඳහන් වේ.





# පොළොන්නරු යුගයේ චිත්‍ර

**පොළොන්නරු යුගයේ චිත්‍ර තවදුරටත් ශේෂව පවතින ස්ථාන කිහිපයක් හඳුනා ගනිමු.**

- ❖ පොළොන්නරුව තිවංක පිළිමගෙයි චිත්‍ර
- ❖ මහියංගන ධාතු ගර්භයේ චිත්‍ර
- ❖ පොළොන්නරුව ගල් විහාරයේ චිත්‍ර
- ❖ දිඹුලාගල මාරවීදියේ චිත්‍ර
- ❖ පොළොන්නරුව ලංකාතිලක විහාරයේ චිත්‍ර

# තිවංක පිළිමගෙයි චිත්‍ර

බුද්ධ ප්‍රතිමාවක් තැම්පත් කිරීමේ අරමුණින් ප්‍රතිමා ගෘහ ඉදිකර තිබේ.

ක්‍රි.ව 12 වන සියවස පළමුවන පරාක්‍රමබාහු රජු විසින් තිවංක පිළිමගේ ඉදිකර ඇත.

පොළොන්නරු යුගයේ හින්දු වාස්තු විද්‍යාත්මක ආභාසය ඇතිව පල්ලව කලා ලක්ෂණ සහිතව නිර්මාණය කළ බෞද්ධ ප්‍රතිමා මන්දිරයකි.

ගෙඩිගේ සම්ප්‍රදායට අනුව ඉදිකර ඇත

තිවංක පිළිමගෙය





බෞද්ධ විහාරස්ථානයක අඳින ලද පැරණිතම ජාතක කතා සිතුවම් දක්නට ලැබෙන්නේ පොළොන්නරුව තිවංක පිළිමගේ හි ය.

මෙහි පියස්ස ද ආරුක්කු ආකාරයෙන් ගඩොලින් ම නිමකර තිබෙන්නට ඇතැයි අනුමාන කෙරේ.

මෙම පිළිමගෙයි පිටත බිත්ති විමාන, දේව රූප, වාමන රූප, සිංහ රූප ආදියෙන් යුක්තය.

මෙම විහාරය ගඩොලින් ඉදිකර හුණු බදාමයෙන් නිමකර තිබේ.


පොළොන්නරු යුගයට අයත් සිතුවම් වැඩිම ප්‍රමාණයක් ශේෂව පවත්නා ස්ථානය තිවංක ප්‍රතිමා ගෘහය යි.




තිවංක පිළිමගෙයට එම නම ලැබී ඇත්තේ පිළිමගෙය ඇතුළත ත්‍රිභංග ලීලාවෙන් යුක්ත බුදු පිළිමයක් පිහිටුවා තිබීම නිසාවෙනි.


උරහිස ,උකුල, දනහිස යන තුන් තැනින් වක් වූ හැඩය ත්‍රිභංග (ති+වංක) ලීලාවයි.

# තිවංක පිළිමගෙයි බිම් සැලැස්ම



# දේවාරාධනාව සිතුවම

මෙම සිතුවමින් තව්තිසා දෙව්ලොව විසූ බෝසතුන්ට මනුලොව උපත ලබන ලෙස දෙවියන් විසින් කරන ලද ආරාධනය දැක්වේ.



අන්තරාලය නම් වාස්තු විද්‍යා කොටසෙහි දක්නට ලැබෙන සිතුවමකි.

මෙම දේව රූප සැබෑ මානව රූප ප්‍රමාණයට වඩා විශාල වේ.




නමස්කාර කරන හා මල් ඉසින ඉරියව් වලින් නිරූපිත දේව රූප බොහොමයක් රන්වන් පාටින් හා නිලට හුරු ලා කොළ පැහැයෙන් දක්වා තිබේ.

චිත්‍රමය අවකාශය මත සංකීර්ණ ලෙස රූප සංරචනය කර තිබේ.

## නිල් පැහැති රුව අජන්තා ලෙන් විහාරයෙහි ඇඳ ඇති පද්මපානී බෝසත් රුවට සමානකම් දක්වන බව විද්වත් මතයයි.






අජන්තා පද්මපානි බෝසත් රුව

වර්ණ භාවිතය : රතු, දුඹුරු, කහ වර්ණ බහුලව භාවිතකර තිබේ. චිත්‍ර වටා රතු පැහැයෙන් සියුම් රේඛා ඇඳ තිබේ.

ශිල්ප ක්‍රමය : ප්‍රෙස්කෝ සිකෝ ( වියළි බදාමය මත චිත්‍ර ඇඳීමේ ශිල්ප ක්‍රමයට ) අනුව වර්ණ ගන්වා තිබේ.

# 2.බුදුන් සංකස්සපුරයට රන් හිනිමගකින් වැඩම කිරීම දැක්වෙන සිතුවම.





බුදුරදුන් මාතෘ දිව්‍ය රාජයාට දම් දෙසීම සඳහා තව්තිසා දෙව්ලොවට වැඩමකර නැවත සක්දෙව් රජු විසින් මවන ලද රන් හිනිමගකින් සංකස්සපුරයට වැඩම කිරීමේ අවස්ථාව මෙයින් නිරූපණය කෙරෙයි.

ගර්භ ගෘහයේ දක්නට ලැබෙන සිතුවමකි.

විශාල තලයක් පුරා චිත්‍ර සංරචනය කර තිබේ.

බුදුන්ගේ රුව සැබෑ මානව රූප ප්‍රමාණයට වඩා විශාලව දක්වා තිබේ.

වර්ණ භාවිතය : රතු, දුඹුරු,කහ

ශිල්ප ක්‍රමය : ප්‍රෙස්කෝ සිකෝ

අනුරාධපුර යුගයේ චිත්‍ර ශෛලීය ලක්ෂණ පෙන්නුම් කරයි.



# 3.තේමිය ජාතකය

බෝධිසත්ව චරිතය දැක්වෙන සුවිශේෂී සිතුවමකි.

**මහනුවර යුගයේ චිත්‍ර ශෛලීය ලක්ෂණ සිහිගන්වයි**

**මණ්ඩපය තුළ ඇඳ ඇති ජාතක කතා සමූහය අතර ඇති ජාතක කතාවකි.**

- පාර්ශවදර්ශී රූප (පැත්තකට හැරී සිටින ඉරියව්වෙන්) සහිත ය.
- මෙය තිරු චිත්‍ර සංරචනයකි.

- අඛණ්ඩ කථන ශෛලියට අනුව ඇඳ තිබේ.
- ඉතා පැහැදිලිව පෙනෙන සිතුවම් කොටසකි.

මෙම සිතුවමින් අත් පා නොසොල්වා සිටින තේමිය කුමාරයාත්, වළක් හෑරීමට සැරසෙන සුනන්ද නම් රථාචාරියාත් ඔහුට ඉදිරිපසින් බෝධිසත්ව විලාසයෙන් සිටින තේමිය කුමාරයාත් දැක්වේ.




වර්ණ භාවිතය : ගුරු, දුඹුරු, කහ, පසුබිම සඳහා රතු වර්ණය


පැවරුම : පහත දැක්වෙන එක් එක් චිත්‍ර හඳුනා ගනිමින් පිළිතුරු සපයන්න.

1.




- හඳුනාගත් බව :
- යුගය:
- ශිල්ප ක්‍රමය :
- වර්ණ භාවිතය :
- සමස්ත සංරචනය:

3.



- තේමාව :
- යුගය :
- ශිල්ප ක්‍රමය :
- චිත්‍ර ශෛලිය අයත්වන යුගය:

2.



- තේමාව :
- යුගය :
- ශිල්ප ක්‍රමය :
- වර්ණ භාවිතය :

# තිවංක පිළිමගෙයි චිත්‍ර ඇසුරින් නිර්මිත පසුගිය විභාග ප්‍රශ්න

| තේමාව | වර්ෂය | ප්‍රශ්න අංකය |
|---|---|---|
| තිවංක පිළිමගෙයි චිත්‍ර | 2010 | 12 |
| | 2013 | 11 |
| | 2016 | 07 |
| සංකස්සපුර දර්ශනය | 2012 | 25 |
| | 2014 | 23 |
| | 2015 | 22 |
| | 2019 | 30 |
| දේවාරාධනය | 2020 | 25 |

2010 12

පොළොන්නරුවේ තිවංක පිළිමගෙය තුළ,

(1) දක්නට ඇති සිතුවම් ශෛලිය පොළොන්නරුවේ වෙනත් ස්ථානයක දක්නට නොමැත.

(2) දක්නට ඇති සිතුවම් ශෛලියේ ආභාසය ඉන්පසු යුගවලට බලපා ඇත.

(3) මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදායට සමීපකම් දක්වන චිත්‍ර රැසක් හමුවේ.

(4) පොළොන්නරු යුගයේ හා ඉන් පසු කලෙක බිහි වූ චිත්‍ර කලා ආරක ලක්ෂණ දක්නට ලැබේ.

2012 25

පොළොන්නරුව **තිවංක පිළිමගෙය** තුළ දක්නට ලැබෙන ..............................බුද්ධ චරිතයේ වැදගත් අවස්ථාවක් නිරූපණය කෙරේ.

2013 11

පොලොන්නරුවේ **තිවංක පිළිමගෙය** වඩාත් විචාරක ප්‍රසාදයට පාත්‍ර වන්නේ,

(1) හින්දු ආගමික ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රමය අනුව නිමකර ඇති නිසා ය.
(2) ගිංජිකාවසත ක්‍රමය අනුව වහලය සකසා ඇති නිසාය.
(3) පොළොන්නරු යුගයේ චිත්‍ර කලා නිර්මාණ රැසක් හමුවන කලාගාරයක් ලෙස සැලකෙන නිසා ය.
(4) පරාක්‍රමබාහු නරපතියන් විසින් ඉදිකරන ලද විහාරස්ථානයක් නිසා.


2014 23

**තිවංක පිලිමගෙයි** දක්නට ඇති මුල් යුගයේ සිතුවම් වලින් එක් සිතුවමක් **දේවාරාධනාව** අතර අනෙක් සිතුවම ......................................නමින් හැඳින්වේ.

**2015** 22

තිවංක පිළිමගෙයි මුල් යුගයේ සිතුවම් අතුරෙන් ..................................නම් වූ සිතුවමින් බුදු සිරිත හා සම්බන්ධ පුවතක් නිරූපණය කෙරේ.

**2017** 25


• අංක 21 සිට 25 තෙක් දී ඇති රූපවල වඩාත් සෘජු සබඳතාවක් දක්වන රූප සටහන ඒ ඉදිරියෙන් ඇති A, B, C, D, E යන රූප අතුරෙන් තෝරා **තින් ඉරි** මත යොදන්න.

21. (........) A


22. (........) B

23. (........) C

24. (........) D

25. (........) E

2019 25.




30. **පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි** ගර්භ ගෘහයේ සිතුවම් අතරින් දේවාරාධනය හා ..................... යන සිතුවම් ඉපැරණි සිතුවම් සේ සැලකේ.

# පොළොන්නරු යුගයේ ශෛලමය ප්‍රතිමා

ශෛලමය ප්‍රතිමා යනු ගලින් කළ යන අදහසයි.

## පොළොන්නරු ගල් විහාර බුදු පිළිම සතර-

- සමාධි බුද්ධ ප්‍රතිමාව
- විද්‍යාධර ගුහාවේ බුද්ධ ප්‍රතිමාව
- හිටි බුද්ධ ප්‍රතිමාව
- සැතපෙන බුද්ධ ප්‍රතිමාව

ක්‍රි. ව 12 වන සියවස පොළොන්නරු යුගයේ දී මහා පරාක්‍රමබාහු රජු විසින් ඉදිකර තිබේ.

# පොළොන්නරුව ගල් විහාරයේ බුදු පිළිම සතර




ගල් විහාරය **උත්තරාරාමය** ලෙස ද හැඳින්වේ.

**පොළොන්නරුව ගල් විහාර සංකීර්ණයේ පිහිටි ගලක, එක පෙළට නෙලා ඇති බුදු පිළිම 4කි.**

# ගල් විහාර බුදු පිළිම වලට පොදු ලක්ෂණ

- මහායාන සම්ප්‍රදායට අනුව, බුදුන්ගේ මහා කරුණා ගුණයට වඩා දශබලධාරී ගුණය හා වීරත්වය දක්වා තිබේ.
- බුද්ධ ශරීරය ඉතා විශාලව දැක්වීම.
- ඒකාංශ කරන ලද ඇඟට ඇලුණු චීවරයේ රැලි සමාන්තර ද්විත්ව රේඛා වලින් දැක්විම.
- අඩවන් දෙනෙත්
- ලඹ සවන්
- අක්ඛඹරු හිසකෙස්



# කැටයම් නෙලීමේ ශිල්ප ක්‍රම කිහිපයකි.


- **අල්ප උන්නත** -තලයෙන්, නිර්මාණය ස්වල්ප ප්‍රමාණයක් මතුකර දැක්වීම.
- **අර්ධ උන්නත-** තලයෙන් නිර්මාණය අඩක් මතුකර දැක්වීම.
- **අධි උන්නත-** තලයෙන් නිර්මාණය අඩකට වැඩි ප්‍රමාණයක් මතුකර දැක්වීම.
- **පූර්ණ උන්නත**-තලයෙන් නිර්මාණය සම්පූර්ණයෙන්ම මතුකර දැක්වීම.

ගල් විහාර ප්‍රතිමා අධි උන්නත ශිල්ප ක්‍රමයට අනුව නෙලා තිබේ.

හිටි බුද්ධ ප්‍රතිමාව



# 1.සමාධි බුද්ධ ප්‍රතිමාව ( විශාල හිඳි පිළිමය )




විමාන තුළ වැඩ හිඳින කුඩා බුද්ධ ප්‍රතිමා

මකර මුඛ

පිළිමය පිටුපස ඇති අර්ධ වෘත්තාකාර ආරුක්කුවේ පිපුණු නෙළුම් මල් 10 කි.

පිළිමයට පිටුපසින් අලංකාර තොරණකි.


අධි උන්නතව නෙලා ඇත.
ධයාන මුද්‍රාවෙන්,වීරාසන ක්‍රමයට වැඩහිඳී.
ප්‍රතිමාවේ උස අඩි 15 කි.
වජ්‍ර සලකුණ සහ සිංහ රූ සහිත වජ්‍රාසනය
ඒකාංශ චීවරය, ද්විත්ව රේඛා සහිත ඇඟට ඇලුණු ස්වභාවයෙන් දක්වා තිබේ.
සිංහ රූප
වජ්‍ර සලකුණ

# 3.විද්‍යාධර ගුහාවේ බුද්ධ ප්‍රතිමාව



ශ්‍රී ලාංකේය ගල් කැටයම් අතර ගලක අභ්‍යන්තරයට කපා සකස් කළ පළමු විශාල ගුහාව විද්‍යාධර ගුහාවයි.

# 2.විද්‍යාධර ගුහාවේ බුද්ධ ප්‍රතිමාව



තොරණ

ධ්‍යාන මුද්‍රාව


වීරාසන ක්‍රමය

වජ්‍ර සලකුණු

වජ්‍රාසනය මත ( වජ්‍ර සලකුණු දැක්වෙන පීඨිකාවක් මත )බුදුපිළිමය තැම්පත් කර තිබේ.වජ්‍ර සලකුණු දෙපස සිංහ රූප දක්නට ලැබේ.

ප්‍රතිමාවේ උස අඩි 4 අඟල් 7 යි.

ඡත්‍රය



ප්‍රතිමාව දෙපස ඉහළින් දේවතා රූප

ප්‍රතිමාව අධි උන්නතව මතුකර තිබේ.(තලයෙන් නිර්මාණය අඩකට වඩා වැඩි ප්‍රමාණයක් උන්නතව මතුකර දක්වා තිබේ.

බුදු පිළිමයේ චීවරය ඒකාංශ ද්විත්ව රැලි මගින් දක්වා තිබේ.
ලඹ සවන් හා අක්බඹරු කේෂකලාපය මත උෂ්ණීෂය දක්වා තිබේ.
මහායාන ලක්ෂණ ප්‍රතිමාව තුළින් නිරූපණය කෙරේ.




චාමර සලන්නන්



# 3.ගල් විහාර හිටි පිළිමය





හිටි ඉරියව්වෙන්

අධි උන්නත

පරදුක්ඛ දුක්ඛ මුද්‍රාව

ආනන්ද තෙරුණ් බව

ත්‍රිභංග ඉරියව්ව

පද්මාසනයක් මත වැඩහිඳින නිසා බුද්ධ ප්‍රතිමාවක් බවට අදහස් කරයි.

ද්විත්ව රැලි සහිත චීවරය ඇඟට ඇලී ඇත.


# සැතපෙන බුද්ධ ප්‍රතිමාව




මෙම ප්‍රතිමාව අඩි 46 ,අඟල් 4 දිගින් යුක්ත වේ.



ගල් විහාරයේ
දකුණුපස කෙළවර
සැතපෙන
ඉරියව්වෙන්
නෙලා තිබේ.



බුදුන්ගේ පිරිනිවන් මංචකය නිරූපණය වන බව ඇතැමෙකුගේ අදහසයි.

ප්‍රතිමාවේ ශීර්ෂය තබා ඇති කොට්ටය එබී ඇති ආකාරය දැක්වීම තුළින් ගල්විහාර ශිල්පියාගේ දක්ෂතාවය ඉස්මතු වේ.



පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රය අසල **පොත්ගුල් විහාරය** ඉදිරිපිට මෙම ශෛලමය ප්‍රතිමාව නෙලා තිබේ.

# පොත්ගුල් විහාර ප්‍රතිමාව

ක්‍රි. ව 12 වන සියවසට අයත් වේ.





මෙම පුද්ගලයා කල්පනාකාරී ස්වරූපයෙන් යුත්තව තම දෙඅත මත ඇති වස්තුව දෙස බලා සිටී.

මුඛය දෙකෙලවරින් උඩු රැවුල පහතට නැමී ගොස් ඇත. ළය පෙදෙස දක්වා යටි රැවුල වැවී ඇත.

මනාව වැඩුණු ශරීරයක් සහිත පුද්ගලයකු ලෙස දක්වා තිබේ.

ප්‍රතාපවත්, මහේශාකාය ලීලාවෙන් යුත් පෙනුමක් ඇත.

දෝතියක් වැනි ඇඳුමකින් යටිකය අලංකාරව දක්වා තිබේ.




ත්‍රිභංග ඉරියව්වෙන් ( උරහිස, ඉන,දණ යන තුන් තැනින් වක් වූ) රිද්මානුකූලව සිටගෙන සිටී.

පිහිටි ගලක, අධි උන්නතව නෙලා තිබේ.

## පොත්ගුල් විහාර ප්‍රතිමාව පිළිබඳව පවතින විවිධ මතවාද

- පැරකුම් රජු බව
- පොළොන්නරුවේ විසූ ගුරුළුගෝමී පඬිවරයා බව
- කපිල සෘෂිවරයා බව
- දැත දරා ඇති දෙයින් රාජ්‍යත්වය සංකේතවත් කරන බව
- පුලස්ති සෘෂිවරයා බව




# පොළොන්නරු යුගයේ ශෛලමය ප්‍රතිමා ඇසුරින් නිර්මිත පසුගිය විභාග ප්‍රශ්න

| තේමාව | වර්ෂය | ප්‍රශ්න අංකය |
|---|---|---|
| ගල් විහාරය | 2012 | 10 |
| | 2015 | 11 |
| | 2016 | 11 |
| ගල් විහාර හිටි පිළිමය | 2013 | 28 |
| | 2017 | 33 |
| | 2020 | 7 |
| පොත්ගුල් විහාර ප්‍රතිමාව | 2014 | 22 |
| | 2018 | 32 |

2012 10

පිහිටි ගලින් නෙලන ලද ආබද්ධ පිළිම සඳහා පොළොන්නරුවේ වඩාත්ම වැදගත් ස්ථානය කුමක්ද?

2013 28




**H** අක්ෂරයෙන් දැක්වෙනුයේ .................................. මුද්‍රාවෙන් යුතු ගල් විහාරයේ හිටි පිළිමයේ ශීර්ෂ කොටසකි.

**2014**

22

පොළොන්නරුවේ පොත්ගුල් විහාර භූමියේ දක්නට ඇති පිළිරුවේ අත දරණ වස්තුව ......................................බව සෙනෙරත් පරණවිතාන මහතා පවසයි.

**2015**

12

පොළොන්නරුවේ ආලාහන පිරිවෙනට අයත් උත්තරාරාමය නම් වූ පිළිමගෙය,

(1) මහායාන බලපෑම මත ශ්‍රී ලංකාවේ ඉදිවූවකි.

(2) ඉන්දීය ද්‍රවිඩ කලා නිර්මාණයන්ගේ ආභාසයන් මත ශ්‍රී ලංකාවේ ඉදි වූවකි.

(3) ද්‍රවිඩ ආධිපත්‍යය යටතේ ඉදි වූවකි.

(4) නිශ්ශංකමල්ල රජු දවස ගලින් නිම වූවකි.

2016

12

පොළොන්නරුවේ ගල් විහාරය හෙවත් උත්තරාරාමය,

(1) ගල් පර්වතයක් උපයෝගී කරගෙන නිර්මාණය කරන ලද විහාරස්ථානයකි.
(2) පර්වත හාරා පිළිම නිර්මාණය කර ඇති ස්ථානයකි.
(3) හිටි සහ හිඳි ඉරියව් වලින් යුතු පිළිම දක්නට ඇති ස්ථානයකි.
(4) පිහිටි ගලෙන් නෙළන ලද පිළිම හතරක් දක්නට ඇති ස්ථානයකි.

2017



F G H I J

33

H අක්ෂරයෙන් දැක්වෙන පිළිමය කෙරෙහි ලැබී ඇති ඉන්දීය කලා ආභාසය කුමක්ද?

2018 32



F



G



H



I



J

G අක්ෂරයෙන් දැක්වෙන පිළිරුව පොළොන්නරුවේ .............................. භූමියේ දක්නට ඇත.

# හින්දු ආගමික ලෝකඩ ප්‍රතිමා




# ශිව දෙවියන්ගේ තාණ්ඩව නර්තන විලාසය දැක්වේ

## නටරාජා ප්‍රතිමාව


- හින්දු ආගමික මූර්තියකි.
- ක්‍රි.ව 12 වන සියවසට අයත් වේ.
- දැනට කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරෙයි.
- මෙම ප්‍රතිමාව පොළොන්නරුවේ අංක 01 ශිව දේවාලයෙන් හමුව තිබේ.




# නටරාජ ප්‍රතිමාවේ අත් වලින් දැක්වෙන සංකේත හා මුද්‍රා






නිදහස, අභය දීම හා ආරක්ෂාව




අලි හොඬවැලක ස්වරූපයෙන් අත්ල හා ඇඟිලි පහළට දිගුකර දැක්වේ.බාධක ඉවත් වී නිදහස ලැබීම සංකේතවත් කරයි.

වම් පය ඔසවා රගයි.
දකුණු පාදයෙන් සිරුරේ බර දරා ගනිමින් වාමනයකු පාගා සිටී.මෙම වාමන රුවින් අවිද්‍යාව සංකේතවත් කරයි.




ලෝකඩ මාධ්‍යයෙන්
ලෝහ වාත්තු කිරීමේ ඉපැරණි ශිල්ප ක්‍රමය පෙන්වන විශිෂ්ඨ නිර්මාණයකි.
පූර්ණ උන්නතව නිමවා ඇත.

- කෙස් කලඹ තුළ ඇති කිඳුරු රුවින් ගංගානම් ගඟ නිරූපණය කරයි.
- හිස පැළඳි ඔටුන්නෙහි අඩ සඳක්, මිනිස් හිස්කබලක් , කිඳුරු රූපයක් හා නාග රුවක් දැක්වේ.
- මූර්තියේ දකුණු කනෙන් පුරුෂ කර්ණාභරණයක්
- වම් කනෙන් ස්ත්‍රී කර්ණාභරණයක් දැක්වේ .
- ග්‍රීවාභරණ පැලඳ සිටී.

ශිව දෙවියන්ගේ පත්නිය වූ පාර්වතී දෙවඟන මෙම ප්‍රතිමාවෙන් නිරූපණය කෙරෙයි.

## ශිව කාම සුන්දරී ප්‍රතිමාව



ඇය ශිවගේ පත්නිය වූ නිසා ශිව ශක්ති, ශිව කාම සුන්දරී ලෙස හඳුන්වයි.

ස්ත්‍රී ලාලිත්‍යය මැනවින් ප්‍රකට කරන විශිෂ්ඨ නිර්මාණයකි.

- පොළොන්නරුව අංක 5 දරණ ශිව දේවාලයෙන් හමුව තිබේ.
- දැනට පොළොන්නරුව ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරෙයි.
- ක්‍රි.ව 12 වන සියවසට අයත් වේ.
- ලෝකඩ මාධ්‍යයෙන් ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමයට අනුව නිමවා තිබේ.
- හිස් පලඳනාව, ඇඟට ඇලුණු වස්ත්‍ර අලංකාරව දක්වා තිබේ.



# දෑතින් දැක්වෙන මුද්‍රා




දකුණු අත - කටක හස්ත මුද්‍රාව ( යමක් අතින් අල්ලාගෙන සිටින ආකාරය )






වම් අතින් - ලෝල හස්ථ මුද්‍රාව (පහලට වැටුණු අතෙහි අත්ල හා ඇඟිලි රිද්මයානුකූලව පොලොවට දිගුවන ලෙස නිරූපණය කරයි).කාන්තා දේව රූපවල බහුලව භාවිත කරන මෙම මුද්‍රාවෙන් තැම්පත් බව සංකේතවත් කරයි.

# ගණදෙවි ප්‍රතිමාව

## ශිව හා පාර්වතීගේ වැඩිමහල් පුත්‍රයා  වූ ගණ දෙවියන්

පොළොන්නරුව අංක 5 දරණ ශිව දේවාලයෙන් හමු වූ හින්දු ආගමික ප්‍රතිමාවකි.

ක්‍රි. ව 12 වන සියවසට අයත් වේ.
පොළොන්නරුව කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත.
ලෝහ වාත්තුකිරීමේ ශිල්ප ක්‍රමයට අනුව  නිමකර තිබේ.



නුවණට අධිපති දෙවියන් මෙන්ම බාධක ඉවත්


ඇත් හිස
නෙලුම් මල් පෙති වලින් අලංකාර කරන ලද ඕවලාකාර හැඩයකින් යුක්ත පද්මාසනය
පද්මාසනය හින්දු දේව පප්‍රතිමාවල බහුල වශයෙන් දැකිය හැකි ආසන ක්‍රමයකි.
විශාල උදරය



පිටුපස වමත
අක්ෂර මාලාව
ඉදිරිපස වමත
අඹ ගෙඩියක්
ඉදිරිපස දකුණත
(බිඳුණු දළයක්)
රාජලීලාසනය
වම් පය තිරස් අතට නවා, දකුණු පය සිරස්ව නවා, ඒ මත දකුනු අතේ වැලමිට තබා සිටී.

# කාරයික්කාල් අම්මෙයියාර් ප්‍රතිමාව

## හින්දු ආගමික මූර්තියකි.

ශිව දෙවියන් කෙරෙහි වූ අසාමාන්‍ය භක්තිය නිසා තම නාරී( කාන්තා)සෞන්දර්ය අහිමි කරවන ලෙස දෙවියන්ගෙන් කළ ඉල්ලීම නිසා කෘෂව ( කෙට්ටු / කැහැටු ) අශෝභන තැනැත්තියක් බවට පත් වූ **කාන්තාවක්** මෙම මූර්තියෙන් දැක්වේ.



පොළොන්නරුව අංක 5 ශිව දේවාලයෙන් හමුව ඇත.



වර්තමානයේ පොළොන්නරුව කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ.

ශිව දෙවියන් කෙරෙහි ඇය තුළ පැවති අසාමාන්‍ය භක්තිය නිරූපණය කිරීම සඳහා තාලම්පට වයන ආකාරය දක්වයි.

## හින්දු කලාත්මක පරිකල්පනයේ උසස් නිර්මාණයකි.


යුගය - ක්‍රි.ව 12
මාධ්‍ය - ලෝකඩ
ශිල්ප ක්‍රමය - ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය


# සුන්දරමූර්තිස්වාමි ප්‍රතිමාව

ක්‍රි. ව 11වන සියවසට අයත් ය.

ලෝකඩ ප්‍රතිමාව කි.

පොළොන්රුව අංක 5 දරණ ශිව දේවාලයෙන් හමුව තිබේ.





කොළඹ ජාතින තෞතුකාගායේ ප්‍රදර්ශනය කෙරෙයි.

සුන්දරමූර්තිස්වාමී යනු ශිව ආගමේ දැක්වෙන් හැට තුන්දෙනෙකුගෙන් යුත් ශාන්තුවරයන්ගෙන් කෙනෙකි.ඔහු තේවාරම නමැති හින්දු ස්තෝත්‍ර ලියා දේවාලයෙන් දේවාලයට යමින් ඒවා ගායනා කරයි.

සුන්දරමූර්තිස්වාමි නමැති ශිව භක්තිකයා මෙම ප්‍රතිමාවෙන් නිරූපණය කරයි.







තාරුණ්‍යය, කඩවසම් බව , ලාලිත්‍යය

හින්දු කලා නිර්මාණ අතර සුවිශේෂී නිර්මාණයකි.

මංගල ඇඳුමකින් සැරසුණු යෞවනයකුගේ විලාසයෙන් මොහු දක්වා තිබේ.

# හින්දු ආගමික ප්‍රතිමා ඇසුරින් නිර්මාණය වූ පසුගිය විභාග ප්‍රශ්න

| තේමාව | වර්ෂය | ප්‍රශ්න අංකය |
|---|---|---|
| හින්දු මූර්ති | 2012 | 14 |
| නටරාජා මූර්තිය | 2010 | 13 |
| | 2013 | 1,2,3,4,5 |
| | 2015 | 23 |
| | 2017 | 13 |
| පාර්වතී මූර්තිය | 2018 | 32 |
| ගණදෙවි මූර්තිය | 2019 | 31 |
| කාරයික්කාල් අම්මෙයියාර් | 2016 | 34 |
| | 2020 | 32 |
| සුන්දර මූර්ති ස්වාමි | 2017 | 32 |

2010 13

නටරාජා පිළිරුවේ සංකේත අතුරෙන් අවිද්‍යාව සංකේතවත් කිරීම සඳහා යොදාගෙන ඇත්තේ,

(1) උඩැක්කියයි.

(2) ගිනිසිළුවයි.

(3) වාමන රූවයි.

(4) ගජහස්ත මුද්‍රාවයි.

2012 14

**පොළොන්නරුවෙන් හමු වූ හින්දු ආගමික දේව ලෝකඩ මූර්තිවල දක්නට ඇති පොදු ලක්ෂණයක් වනුයේ,**

**(1) පද්මාසනයක් මත වැඩහිඳීමයි.**

**(2) ත්‍රිභංග ඉරියව්වෙන් යුක්ත වීමයි.**

**(3) සළුපිළි අභරණ බහුලව යෙදීමයි.**

**(4) සියලුම රූප තනි තනිව යොදා තිබීමයි.**

2013

01 සිට 05 දක්වා ප්‍රශ්න



(01)ශිව දෙවියන්ගේ තාණ්ඩව නර්තන විලාසය දැක්වෙන මෙම මූර්තිය ..............නමින් හැඳින්වේ.

(02) උසස් මූර්තිමය ලක්ෂණ නිරූපණය වන මෙම පිළිරුව ...........................මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය කර ඇත.

(03) මෙම මූර්තියෙන් ජීවියාගේ මැවීම,පැවැත්ම,...........................අවිද්‍යාහරණය හා ආශිර්වාදය සංකේතවත් කෙරේ.

(04) නර්තනයේ වේගය අන්ව දෙපසට විහිදී යන කෙස් රොදින් ...........................සංකේතවත් වෙතුයි පැවසේ.

(05)මෙවැනි මූර්ති රැසක් ................................යුගයේ හින්දු දේවාල ආශ්‍රිතව හමු වී ඇත.

2015

23

නටරාජා පිළිරුවේ දකුණු පාදයෙන් වාමනයකු පාගාගෙන සිටීමෙන්...........................සංකේතවත් කෙරෙයි.

2017 13

පොලොන්නරුවෙන් හමු වූ නටරාජා හින්දු දේව මූර්තියෙන්,

(1) රංගනයේ යෙදෙන දෙවියෙකු නිරූපණය කරයි.

(2) ශිව දෙවියන්ගේ බලය හා ශක්තිය නිරූපණය කරයි.

(3) භක්තිකයන් කෙරෙහි දෙවියන් දක්වන දයාව සිහිපත් කෙරෙයි.


(4) ශිව දෙවියන්ගේ තාණ්ඩව නර්තන විලාසය පිළිබිඹු කෙරෙයි.




32


**G** අක්ෂරයෙන් දැක්වෙන ශිව භක්තික ශාන්තුවරයා කවරෙක්ද? ....................

2018 **31**




F අක්ෂරයෙන් දැක්වෙන ශිව දෙවියන්ගේ පතිණිය වන ශිව කාම සුන්දරී වඩාත් ප්‍රචලිත වන්නේ .................. නමිනි.(2018)

2019 22



● අංක 21 සිට 25 තෙක් දී ඇති රූපසටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූපසටහන, ඉදිරියෙන් ඇති A, B, C, D, E යන ඒවා අතුරෙන් තෝරා, එහි අක්ෂරය **තිත් ඉර මත** ලියන්න.

21. (.........) A


22. (.........) B

23. (.........) C

24. (.........) D

25. (.........) E

31




F අක්ෂරයෙන් දැක්වෙන හින්දු ආගමික ලෝහ මූර්තිය නිමවා ඇති ශිල්ස ක්‍රමය කුමක්ද ?....................

# පොළොන්නරු යුගයේ ගෘහ නිර්මාණ



ගෘහ නිර්මාණ ශිල්පය යනු ගොඩනැගිලි ඉදිකිරීමේ ශිල්පය යි.

# නිශ්ශංකලතා මණ්ඩපය

ක්‍රි.ව 12 වන සියවස ( ක්‍රි.ව 1187 – 1196 )

නිශ්ශංකමල්ල රජු විසින් ඉදිකරවන ලදී.

**ලක්දිව ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ඨ නිර්මාණයකි.**

**නිශ්ශංකමල්ල රජු ධර්මය ශ්‍රවණය කිරීම, දළදා වහන්සේ වන්දනා කිරීම හා පිරිත් ශ්‍රවණය කිරීම වැනි ආගමික කටයුතු සදහා මෙම ගොඩනැගිල්ල භාවිතා කර තිබේ.**



පිවිසීමේ දොරටුව

මෙහි මණ්ඩපය කොටසය පිවිසීම
සදහා එක් පසෙක වන දොරටුවකි.



ගරාදි වැට



මෙහි දැක්වෙන ගල්
ගරාදි වැට
අනුරාධපුරයේ
ජේතවනාරාමය අසල
ඇති නිර්මාණ වලට
සමාන ය.




ආයත චතුරස්‍රාකාර
[ සෘජුකෝණාස්‍රාකාර ] හැඩැති
මණ්ඩපය

# මෙම මණ්ඩපය මැද කුඩා බුබ්බුලාකාර හැඩැති දාගැබකි.



දාගැබ පාදමේ වාඩි වී වන්දනාවේ යෙදෙන මානව රූප



දිය බුබුලක හැඩයට නිර්මාණය කළ චෛත්‍යය

බුබ්බුලාකාර හැඩැති චෛත්‍යය

මෙම ගොඩනැගිල්ලේ දැකි
හැකි සුවිශේෂි නිර්මාණය
වන්නේ අලංකාර කුලුණු
නිර්මාණයන් ය.





කුලුණු ශීර්ෂය
අඩක් පිපුණු
නෙළුමකි.

නෙළුම් ශාකයේ අංග
රිද්මයානුකූලව
භාවිතකර, **නෙළුම්
දඬුවක්** ආකාරයෙන්
කුලුණු නිර්මාණය
කර තිබේ.

කුළුණක
උස අඩි 7
කි.

ගල් කණු 8



බුබ්බුලාකාර හැඩැති චෛත්‍යය

අව් වැසි ආදියෙන් කුඩා ස්තූපය අාරක්ෂා කිරීම සදහා ,ස්තූපය වටා තැනූ ගෘහය අලංකාර ගෘහය වටදාගෙය වශයෙන් හැඳින්වේ.


# පොළොන්නරුව වටදාගෙය




**වටදාගෙය, චේතියඝර, ථූපඝර, වට්ධාතුගෙය යන නමින් ද හැඳින්වේ.**

# මෙය වෘත්තාකාර ධාතු මන්දිරයකි.


දළදා මළුවේ පිහිටි ගල්පොත සෙල්ලිපියට අනුව මෙම වටදාගෙය නිශ්ශංකමල්ල රජුගේ නිර්මාණයකි.මෙය පරාක්‍රමබාහු රජුගේ නිර්මාණයක් වශයෙන් ද අනුමාන කරයි.



පොළොන්නරුව වටදාගෙය බිම සැලසුම



වටදාගෙයක පැති පෙනුම



වටදාගෙයක පැති පෙනුම



පොළොන්නරුව ජාතික කෞතුකාගාරයෙහි තබා ඇති පොළොන්නරුව වටදාගෙය අනුරුව


වටදාගෙයට පිවිසීමේදී පළමුවන සලපතල මළුවට පසුව ඇති දෙවන සලපතල මළුව මැද දාගැබකි.

සලපතල මළුව මාලක යන නමින් ද හැඳින්වේ.

දෙවන මාලකයට ඇතුළුවන දොරටු සතර

පළමු සලපතල මළුවට පිවිසෙන ප්‍රධාන දොරටුව

පළමු සලපතල මළුව( පළමු මාලකය )




මාලක 2 හි ම බිම ගල් අතුරා තිබේ.

දෙවන සලපතල මළුව (දෙවන මාලකය)


පළමු සලපතල මළුව වටා පෙති සතරේ අලංකාර බිනර මල් රටාවකින් යුත් ගල් බැම්මකි.



බිනර මල් රටාව








සෑම දොරටුවක්ම කොරවක් ගල්, සදකඩ පහණ, මුරගල් හා පියගැටපෙළකින් අලංකාර වූ ද්වාර මණ්ඩප සහිතව නිර්මාණය කර තිබේ.






නාග රාජ රූපය සහිත මුරගල




පොළොන්නරු යුගයේ නිර්මිත කලාත්මක සඳකඩපහණ සහ නා රජ රුව සහිත මුරගල

# ශිව දේවාල අංක 01 (13 වන සියවස)

ශිව දේව වන්දනය සඳහා නිර්මිත ලෝකඩ මූර්ති රැසක් මෙහි තිබී හමුව ඇත.

මෙම දෙවොල දකුණු ඉන්දීය පාණ්ඩ්‍යය ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදිකර ඇත.

හින්දු ගෘහ ලක්ෂණ වන මණ්ඩප ,ගර්භගෘහ හා අන්තරාලය යන කොටස් වලින් සමන්විතය.

මෙම දෙවොලේ විශේෂත්වය වන්නේ බදාම භාවිතා නොකොට නියමිත පරිද්දෙන් කපා කොටස් කරන ලද පාෂාණයන් ඒකාබද්ධ කර ඇති ආකාරය යි.

මෙහි සතරැස් ගර්භ ගෘහය මැද ශිව ලිංගය තැම්පත් කර තිබේ.

මෙහි දක්නට ලැබෙන සුවිශේෂී වාස්තු විද්‍යා ලක්ෂණ ලෙස පිටත බිත්තිවල පැන්නුම් කුලුණු ,විමාන, නෙළුම්මල් ආකාරයේ පේකඩ ලක්ෂණ, සත්ත්ව රූප සහ සිංහ මුඛ වලින් අලංකාර කළ බොරදම් සහිත ගල් අඩිතාලම




# ශිව දේවාල අංක 02 (ක්‍රි.ව 10/11 වන සියවස චෝල පාලන සමය )

පොළොන්නරු යුගයට අයත් ඉපැරණිම ශිව දේවාලය මෙය යි.

**මෙම දෙවොල එකල රාජ රාජ චෝල රජු සිය බිසව සිහිවීම සඳහා කරවා තිබේ.**

මෙය කුඩා දේවාලයකි.


ගර්භ ගෘහය තුළ ශිව ලිංගය තැම්පත් කර තිබේ.



මෙම ස්ථම්භයන්ට ඉහළින් පිරමීඩාකාර පියස්සකි.

## ශිව දේවාලය අංක 02

එම පියස්ස මහල් (කොටස් ) තුනකින් සමන්විත වේ.



හැඩගන්වන ලද පාදමක් මත දෙවොල ගොඩනංවා තිබේ.
දෙවොලේ පිටත බිත්ති අන්තර් සම්බන්ධතා සහිත ස්ථම්භයන්ගෙන් අලංකාර කර ඇත.


පොළොන්නරුව ගෘහ නිර්මාණ ඇසුරින් නිර්මාණය වූ පසුගිය විභාග ප්‍රශ්න

| තේමාව | වර්ෂය | ප්‍රශ්න අංකය |
|---|---|---|
| නිශ්ශංකලතා මණ්ඩපය | 2011 | 28 |
| | 2015 | 29 |
| | 2017 | 1,2,3,4,5 |
| | 2019 | 27 |
| පොළොන්නරුව වටදාගෙය | 2010 | 23 |
| | 2012 | 17 |
| ශිව දේවාල අංක 01 | 2011 | 09 |
| | 2020 | 13 |
| ශිව දේවාල අංක 02 | 2014 | 26 |
| | 2019 | 12 |

2011 09


13 වැනි සියවසේ පොළොන්නරුවේ ඉදි වූ දැනට නටබුන්ව පවත්නා අංක 01ශිව දේවාලය කුමන වාස්තු විද්‍යා ලක්ෂණ පිළිබිඹු කෙරේද?

2011 28





C අක්ෂරයෙයන් නිරූපිත, මෙම අපූර්ව නිර්මාණය සඳහා පොළොන්නරු ශිල්පියා සොබාදහමේ කුමන සජීවී වස්තුවක් උපයෝගී කොටගෙන තිබේද?


2012 17



2013 16




2014 26



F අක්ෂරයෙන් දැක්වෙන හින්දු කෝවිල 11 වන සියවසයේ චෝලයන් විසින් ..........................දේවිය සිහිවීම වෙනුවෙන් ඉදිකරන ලද්දකි.


2015 29



I අක්ෂරයෙන් නිරූපණය නෙරෙන පොළොන්නරුවේ දළදා මළුවේ දක්නට ඇති මෙම නිර්මාණය කිනම් නමකින් හැඳින්වේ ද ?

2017

01 සිට 05දක්වා



1. මෙම වාස්තු විද්‍යා නිර්මාණය.............................. යුගයේ නිමවූවකි.
2. මෙය ..........................................නමින් හැඳින්වේ.
3. මෙය කරවන ලද්දේ ........................................ රජ දවස ය.
4. මෙහි කුළුණු නිර්මාණය සඳහා ................................... ස්වරූපය ආදර්ශ කොටගෙන ඇත.
5. මෙය ...........................................සඳහා යොදාගෙන ඇත.

2019

12

පොළොන්නරුවේ අංක 02 ශිව දේවාලය,

(1) දකුණු ඉන්දීය පාණ්ඩ්‍ය ගෘහ නිර්මාණ ලක්ෂණ අනුව ඉදිවූවකි.

(2) 13 වන සියවසට අයත් ඉපැරණිම දේවාලය යි.

(3) රාජරාජ රජුගේ මෙහෙසිය සිහිවීම පිණිස ඉදිකරන ලද්දකි.

(4) රාජේන්ද්‍ර චෝල විසින් තම ජයග්‍රහණ සිහිවීම පිණිස ඉදිකරන ලදී.

27

නෙළුම් ශාකයේ අංග රිස්මානුකූලව යොදා ගනිමින් පොළොන්නරු ශිල්පියා කළ අපූරු නිර්මාණය ..............................තුළ දක්නට ලැබේ.


ස්තූතියි.